**දඹුල්ල මහා නගර සභාව.**
**-------------------------**
**මාතලේ දිස්ත්‍රික්කය.**
**----------------------**

**1 මූල්‍ය ප්‍රකාශන**
**---------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**----------------------------**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 30 දිනද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 ජූනි 17 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2016 ජූනි 01 දින නාගරික කොමසාරිස් වෙත යවා ඇත.

**1.2 මතය**
**-------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට දඹුල්ල මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
**-------------------------------------**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**
**----------------------**

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ දින 100 විශේෂ සංවර්ධන ව්‍යාපෘතිය යටතේ නිමකර තිබූ බුලාගල පරණ පාර කුට්ටිගල් ඇතිරීමේ කර්මාන්තයේ අතරදී මුදල් ගිණුම්ගත කිරීමේදී එකතුව රු.832,817 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ හුදකලා ගම්මාන වැඩසටහන යටතේ නිමකර තිබූ දඹුල්ල විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ මාර්ගය සංවර්ධනය කිරීමේ කර්මාන්තයේ ණයහිමි ශේෂය රු.45,822ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් ලැබී තිබුණු වටිනාකම රු.23,658,781 ක් වූ වාහන හා යන්ත්‍රෝපකරන ප්‍රාග්ධනිත කර ගිණුම් වලට ඇතුළත් කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේදී මිලදී ගෙන තිබූ වටිනාකම රු.329,250 ක් වූ ලෙනොවෝ ලැප්ටොප් පරිගණක 03 ක් ගිණුම්ගත කර නොතිබූ අතර, යන්ත්‍ර හා උපකරණවල වටිනාකම රු.84,550 කින් අඩුවෙන් දැක්වුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී පරිත්‍යාග ලෙස ලැබී තිබුණු වත්කම් 03 ක වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කර නොතිබුණි.

(ඊ) මහා නගර සභාව ස්ථාපිත කිරීමේදී වත්කම් හා වගකීම් පැවරීම සම්බන්ධ කමිටු වාර්තාව අනුව දඹුල්ල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු මුදල රු.2,870,766 ක් වුවත්, 2012 මූල්‍ය ප්‍රකාශනවල දඹුල්ල ප්‍රාදේශීය සභාවෙන් ලැබිය යුතු මුදල රු.2,486,916 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි. එම වරද සමාලෝචිත වර්ෂයේදී ද නිවැරදි කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ අනුමැතියලත් හෝටල් 11කින් සමාලෝචිත වර්ෂයේ ලැබුණු ආදායම් රු.1,299,414ක් ආදායම් හා වියදම් ගිණුමට ගෙන නොතිබූ අතර, ලැබිය යුතු ආදායම් රු. 1,844,313ක් සඳහා මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

### 1.3.2 නොසැසඳු පාලන ගිණුම්

------------------------

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.6,045,629ක් වූ ගිණුම් විෂයන් 04කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගි ලේඛන හා වාර්තා වල දැක්වෙන ශේෂයන් අතර රු.320,792ක අසමානතාවයන් නිරීක්ෂණය විය.

### 1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

--------------------------------

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා ගිණුම් විෂයන් 02 කට අදාළ එකතුව රු. 11,473,422ක් වූ ගිණුම් ශේෂ විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

## 2. මූල්‍ය සමාලෝචනය

-------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

--------------

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්ථන වියදමට වඩා වැඩි වූ ආදායම රු.5,141,737 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදමට වඩා වැඩි වූ ආදායම රු.1,689,838 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.3,451,899 ක වර්ධනයක් නිරීක්ෂණය විය.

### 2.2 විග්‍රාහාත්මක මූල්‍ය සමාලෝචනය

---------------------------------

මූල්‍ය ප්‍රතිඵලයේ රු.3,451,897 ක වර්ධනයට අදායම් විෂයයන් 03 ක වැඩිවීම හා වියදම් විෂයයන් අඩුවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

### 2.3 ආදායම් පරිපාලනය

-------------------

### 2.3.1 වරිපනම් බදු

------------

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් බදු ශේෂය රු.5,764,853 ක් වූ අතර වසරකට වඩා වැඩි කාලයක් ඉක්මවූ රු.3,343,935 ක ශේෂ එහි ඇතුළත්ව තිබුණි.

(ආ) දඹුල්ල මහා නගර සභා සීමාව වර්ග කිලෝමීටර් 54.25 ක් දක්වා පැතිර තිබුණද වරිපනම් බදු අය කර තිබුණේ වර්ග කිලෝමීටර් 06 ක පමණ සීමාව තුල පමණි. දියුණු ප්‍රදේශයක් වන දඹුල්ල මහ නගර සභා බල ප්‍රදේශය වරිපනම් ප්‍රදේශයක් බවට පත්කර ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් විශාල ආදායමක් අහිමි වී තිබුණි.

**2.3.2 බදු කුලී**

-------

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ කඩකුලී ආදායම රු.32,916,528 ක් වූ අතර ඉන් සියයට 99 ක් හෙවත් රු.32,818,652 ක ප්‍රමාණයක් ඉකුත් වර්ෂ වලට අදාල හිඟ කුලී බව නිරීක්ෂණය විය.

(ආ) මහානගර සභාවේ කඩ කාමර බදුදීමේදී බදුකරුවන් සමඟ ගිවිසුම් වලට එළඹ නොතිබූ අතර හිඟ කඩ කුලී අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**2.3.3 බලපත්‍ර ගාස්තු**

-------------

සමාලෝචිත වර්ෂය අවසානයට බලපත්‍ර ගාස්තු හිඟ ශේෂය රු.975,868 ක් වූ අතර, ඉන් සියයට 70 ක් ඉකුත් වර්ෂවලට අදාළ හිඟ ශේෂ විය.

**2.3.4 වෙනත් ආදායම්**

---------------

(අ) සමාලෝචිත වර්ෂයේ සම්ප්‍රේෂණ කුළුණු 08 කින් රු.40,000 ක ආදායමක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ඉකුත් වර්ෂවලට අදාල රු.122,718 ක හිඟ විනෝද බදු ආදායම සමාලෝචිත වර්ෂයේදීද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ඉකුත් වර්ෂ වලට අදාල රු.300,417 ක සතිපොල ගාස්තු ආදායම සමාලෝචිත වර්ෂයේදී ද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.3.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

---------------------------

මධ්‍යම පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2015 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වශයෙන් රු.1,008,195 ක් සහ මුද්දර ගාස්තු වශයෙන් රු.7,802,550 ක මුදලක් අයවිය යුතුව තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

--------------------------

**3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

----------------------------

(අ) නගර සභාවේ සේවයේ නියුතු වැඩ පරිපාලකවරයෙක් සභාව සතු වාහන රක්ෂණය කිරීමේදී රක්ෂණ නියෝජිතයෙකු ලෙස කටයුතු කර තිබුණි.

(ආ) “e” නැණ පියස තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය සඳහා රු.327,248ක් වැය කර 2015 මාර්තු මස මධ්‍යස්ථානය ආරම්භ කර ඇතත්, ක්‍රියාකාරී තත්ත්වයේ නොපැවතුණි.

**3.2 අවිධිමත් ගනුදෙනු**

-------------------

(අ) රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ 2007 මැයි 11 දිනැති අංක 09/2007 දරන චක්‍රලේඛයේ 05 වැනි වගන්තිය ප්‍රකාරව විශ්‍රාමික නිලධාරීන් නැවත සේවයේ යෙදවීමේදී ජීවන වියදම් දීමනාව ගෙවිය නොහැකි වුවද, නිලධාරීන් දෙදෙනෙකුට රු. 109,833ක මුදලක් ජීවන වියදම් දීමනා ලෙද ගෙවා තිබුණි.

(ආ) බෝ නොවන රෝග පිළිබඳව ජනතාව දැනුවත් කිරීම "නිරෝගී ලංකා" ජාතික සෞඛ්‍ය වැඩ සටහන යටතේ රුධිර පරීක්ෂණ සිදුකර දීම වෙනුවෙන් පුද්ගලික රෝහලයට සභා අනුමැතියක් නොමැතිව රු.66,912 ක් ගෙවා තිබුණි.

**3.3 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය**

මහා නගර සභා බල ප්‍රදේශයෙන් එකතුවන කසළ, සභාවේ ට්‍රැක්ටර් හතරක් සහ ටිපර් රථයක් යොදා ගනිමින් දිගම්පතහ ප්‍රදේශයේ රජයේ ඉඩමකට දිනපතා බැහැර කරමින් තිබූ අතර මෙමගින් විවිධ පාරිසරික ගැටළු පැන නැගී ඇති බවත්, සභාව විසින් කසළ ප්‍රතිචක්‍රීකරණ වැඩ සටහන් සඳහා අවධානය යොමුකර නොතිබුණු බවත් නිරීක්ෂණය විය.

**3.4 පාරිසරික ගැටළු**

(අ) දඹුල්ල නගරයෙන් ඉවත් කරන කුණු කසල දඹුල්ල දිගම්පතහ රජයේ රක්ෂිතයට දැමීම නිසා වල්අලි හා අනෙකුත් සතුන් මෙම කසළ ආහාරයට ගැනීමෙන් සතුන්ට මෙන්ම පරිසරයට ද විශාල හානියක් සිදුවෙමින් පැවතුණි.

(ආ) සභාවේ ගලියෙන් ගෙන එනු ලබන අපද්‍රව්‍ය විධිමත් ක්‍රමවේදයකට අනුව බැහැර නොකර දිගම්පතහ රජයේ ඉඩමේ වලවල් කපා බැහැර කිරීම නිසා පරිසරය අපවිත්‍ර වී තිබුණි.

**3.5 වත්කම් කළමනාකරණය**

**(අ) නිෂ්ක්‍රීය සහ ඌණ උපයෝජිත වත්කම්**

(i) මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම් විසින් ලබාදී තිබුණු අංක 32-1108 දරණ පැජරෝ රථය 2011 දෙසැම්බර් 08 දින සිට ද, අංක 31 ශ්‍රී 9755 දරණ ජිප් රථය 2011 ඔක්තෝබර් 24 දින සිට ද ප්‍රයෝජනයට නොගෙන නිෂ්ක්‍රීයව පැවතුණි.

(ii) බදු දී තිබුණු කඩ කාමර 07 ක් වසා දමා තිබුණු අතර බදු මුදල්ද අය නොවී පැවතුණි.

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය**

සමාලෝචිත වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණය 2016 අප්‍රේල් 27 දින වන විටද පවත්වා නොතිබුණි.

**4. යහපාලනය හා ගිණුම් කටයුතු භාවය**

**4.1 අයවැය පාලනය**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ වැය විෂයන් 04ක ප්‍රතිපාදන සීමාව ඉක්මවා රු.967,230 ක වියදම් දරා තිබුණි.

(ආ) වැය විෂයයන් 118 ක් සඳහා සලසා දි තිබූ රු.98,283,460 ක එකතු ප්‍රතිපාදන වලින් කිසිදු වියදමක් දරා නොතිබුණි.

(ඇ) අයවැය ලේඛනය ආදායම් විෂයයන් 05 ක් යටතේ අයකර ගැනීමට ඇස්තමේන්තු කර තිබුණු රු.93,452,000 ක් වූ ආදායම් උපයාගෙන නොතිබුණි

**4.2 අභ්‍යන්තර විගණනය**

1988 (මූල්‍ය හා පරිපාලන) රීති 5(7) ප්‍රකාරව අභ්‍යන්තර විගණන ක්‍රමයක් පවත්වා නොතිබුණි.

**4.3 විගණන හා කළමනාකරණ කමිටු**

2014 අගෝස්තු 08 දිනැති පළාත් පාලන කොමසාරිස්ගේ අංක CPC/CLG/1/9/1/4 දරන ලිපිය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවිය යුතු වුවද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වාම එකී කමිටු පිහිටුවීමට පියවර ගෙන නොතිබුණි.

**5. පද්ධති හා පාලනය**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) වත්කම් කළමනාකරණය
(ඈ) වාහන පාලනය
(ඉ) ණයගැතියෝ හා ණයහිමියෝ
(ඊ) මානව සම්පත් කළමනාකරණය